




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## ගල් මල්

**තුංග රළ පතර මැද**
**සුහුඹුලේ පිපෙමී**
**ලවණ ජල රැළි අතර**
**මතක දිය කරමී**

**සැඟව සිට නෙක වණින්**
**පෙති දෙපෙති නඟමී**
**මවිත නෙතු සියක වග**
**නෙතු පුරා විඳිමී**

**සමුදුරේ තව කොනක**
**ඔබ සිටියි, දනිමී**
**නොදන්නා සේ හිඳුම**
**අනගි බැව් හඟිමී**

**මලක් වුව ගලක් වෙමි**
**මුදු කවුළු වසමී**
**තවත් හිරිගල් සුඹුළු**
**හදේ සිර කරමී**

**ධනුෂ්කා නිශාදි කුලරත්න**
( 'සඳ මුදුව මැවෙන්නැති' කාව්‍ය සංග්‍රහය - 2013 )



නූතන කිවිඳියන් අතර මනා අර්ථ පූර්ණ රූපකාර්ථවත් කවි බසක් වහරන කිවිඳියකි ධනුෂ්කා නිශාදි. අප හොඳින්ම දන්න හඳුනන ගල්මලක් ඇසුරෙන් ලියැවුණු කවියකි මේ. ඉතාම සීමිත වචන සංඛ්‍යාවකින් ලියැවී ඇති මේ කවියෙන් කියවෙන්නේ ඇත්තටම ගල්මල් ගැනදැයි සොයා බැලීම වටී. දියෙන් මතුපිට නෙක වණින් දුලන නේක මල් වර්ගයන්ට ඉඳුරාම වෙනස් මල් වර්ගයකි ගල්මල්. අඳුරු සාගර ගැඹරේ හුදකලාව බොහෝ කල් අරගෙන රහසේම වැඩෙන මල් වර්ගයකි ඒ. ඉදින් එවන් ගල්මලක් රූපකයක් ලෙස ගෙන දිග හැරෙන මේ කව කුමක් පිළිබඳ විය හැකිද?

කවියේ පළමු කොටසෙන් හැඟවෙන පරිදි මේ ගල්මල තුංග රළ පතර මැද උත්පත්තිය එනම් ජීවිතය ලබන බව කියැවේ. දියෙන් මතුපිට දිලෙන තාවකාලික සෞන්දර්යයක් බඳු ඕලු නෙළුම් මානෙල් මල්වලට ඉඳුරාම වෙනස් ජීවන රටාවකි මේ ලවණ දිය අතරේ බිහිවෙන ගල්මල්වලට ඇත්තේ. ඒවායේ සෞන්දර්යය තාවකාලික නැත. එක රැයකින් ලබන සෞන්දර්යයක්ද නොවේ ඒ. ලවණ දිය රැළි මැද හෙමි හෙමින් කල් අරගෙන වැඩෙන මේ ගල්මල බොහෝ දුක්ඛ දෝමනස්සයන් හා සමාජ පිරිපත් වලට මුහුණ දෙමින් වඩ වඩා අත්දැකීම් ලබමින් සුපුෂ්පිත වන ජීවිතයක් ගැන කියනවා විය නොහැකිද? සමාජයෙන් නිසර්ගයෙන්ම අතුරු අන්තරා එල්ල වන කාන්තාවක ගේ ජීවිතය මලකට සම කොට, ඒ ඒ කර්කශ අත්දැකීම් ඔස්සේ දිනෙන් දින පදම් වී වැඩෙන හැටි මින් ගම්‍ය මාන නොවන්නේද? ඈ සුහුඹුලේම පිපෙන්නේ සාගර දිය ගැඹරේය. එනම් මේ අනන්ත වූ දුක් ගැහැට පිරි සමාජයේමය. ලවණ රැළි මැද මතක දිය කරනවා යැයි කියන්නේ, දෛනිකව මුහුණ දුන් තිත්ත අත්දැකීම් එකින් එක අමතක කර ඒ සමාජයේම වඩාත් සුබවාදී අනාගතයක් ප්‍රාර්ථනාවෙන් ඉවසා සිටින ගැහැනියකගේ ආත්මීය ස්වරය විය හැකිය.

මේ සමාජ ප්‍රවාහය තුළ, ඈට අත්වන පිරිපතින් ගැලවී සිටීමට නම් ගල්මලක් වාගේම හිත ගල් කරගෙන ඒ සමාජය තුළම සැඟවී සිටිය යුතුය. ඒ බාහිර උපද්‍රවයන්ගෙන් බේරී සිටීමටය. එය තාවකාලික විය හැකිය, නමුත් සහන සලසයි. කරදිය ගැඹරේ පතුලේ සැඟවී සිටිමින් එහි ලවණ සාන්ද්‍රණයම උරා බොමින් හෙමි හෙමින් වැඩෙන ගල්මල, මෙන්න මේ සමාජයීය සිලිටි ස්ත්‍රිය නියෝජනය කිරීමට යොදා ගැනීම කොතරම් බුහුටි වෑයමක්ද? ඈ සැඟවී සිටී. නමුත් ඒ කටුකත්වය විඳිමින්ම පෙති දෙපෙති වී වැඩෙමිනි. ඒ ඇගේ සුන්දරත්වයයි. කාන්තාවකට රූපශ්‍රීය කොතරම් අගීද? එය හෙමි හෙමින් රහසේම වැඩෙන නිසාම නොවේද ඒ තරම්ම සිත් ඇදගන්නේ? පෙති දෙපෙති වී වැඩෙන මේ ගල්මල් දකින නෙතැත්තෝ නෙත් පුරා සිත් පුරා තුටු වෙති; ඒ රුවින් මවිත වී හිතින් බැඳෙති. අඳුරු දිය පත්ලක උපත ලැබුවද, දිනෙන් දින මෝරා වැඩුණු සෞන්දර්යයකට හිමිකම් කියන කිසිවක් දුටු විට සිත් නොදුවා හිඳී යැයි කාට කිව හැකිද? ඈ දැක මවිත වන සියක් නෙතු දකින විට මෙන්න මේ ගල්මලටත් සියුම් සතුටක් ආඩම්බරයක් දැනේ. කාන්තාවන් සතු ඉතා සියුම් ලාලසා ගුණය ඉන් මනාවට ගම්‍ය වේ. තමන් ගේ රූපකාය දැක ඊට මන බඳින්නන් දුටු විට ඇතුල් සිතින් ඔවුන්ද සතුටු වන බවට මෙය ඉඟි බිඟි සපයයි.

කවියේ තුන් වන කොටසට එන විට ඈ වෙනම කතාවක් අපට කියයි. තමන්ගේ රූ සපුව දැක අමන්දානන්දයට පත් වූවන් දැක ඇතුළතින් පිනා ගියද ඇගේ හදවත පතා ගෙනම දුරකින් සිටින්නකු ගැන නොකියා කියන කතාවකි ඒ. හෙතෙම ගල්මලට පෙම් බැඳි කිඳුරෙක් විය හැකිය. නමුත් හේ ඉන්නේ සමුදුරේ ඈත කොණකය. ඉතින් ඒ පිළිබඳ සිතමින් ළතැවුල් විඳිමින් ඉන්නවා වෙනුවට නොදන්නා සේ සිටීම මැනවි යයි ඈ අපට කියය. ඒ දුක හා වේදනාව අවම වන බැවිනි. අප දන්නා පරිදි කාන්තාවන් මුකුත්ම නොකියා සිටින්නේ තමන්ට වැඩිපුරම අවැසි දේ පිළිබඳවය. ධනුෂ්කා ගේ කවියෙන් අන්න එවැනි ස්ත්‍රියකට උරුමවූ සියුම් ගති ලක්ෂණයන් මැනවින් සීරුවෙන් අපට හැඟවෙන්නට දේ. ඒ අතරම තමා පෙම්කරන කිඳුරා හෝ ප්‍රේමවන්තයා පිළිබඳ සාක්ෂිමාත්‍රා නොසඟවා සිටීම ඇගේ ජීවිතය වඩා පහසු කරවයි. එය මේ සමාජය හමුවේ ඈ දෙසට පැන නැඟෙන්නට නියමිත ගැටළු අවම කරයි. ඈ අත පතාගෙන පැමිණෙන සියක් දෙනාගේ මවිත ඇස් මත අපේක්ෂාභංගත්වයේ අඳුරු පටල ජනිත නොකොට ඈ මැදිහත් සිතින් ඉවසා දරාගෙන ඉන්නේ ඈ ඇතුළතින් පතන එකම එක රුව හදවතේ ගැබු රුම තැන ආරක්ෂාකාරීව සඟවාගෙනය. ඉතින් මේ අඳුරු සමුදුර නම් සමාජ ජාලව තුළ, සමුදුර කොනක සිටින හිතගත් කෙනෙකුන් ගැන නොදන්නා සේම සිටීම පුංචි ගල්මලකට කොතරම් උචිතද? ආරක්ෂාකාරීද?

දැන් අපි කවියේ අවසාන කොටසට හැරෙමු. ඒ ගල්මල මෙසේ පවසයි. ඒ මලක් වුණාත් තමා ගලක් බව ඈ දන්නා බවයි. එය සැබෑවකි. එය එසේම විය යුතුය. ඈ කියන්නේ සමුදුරු ගැඹරේ දලු ලන ගල්මල් බැලූ බැල්මට පෙනෙන සෞන්දර්යයට වඩා මහා දුකක් පීඩාවක් උසුලා සිටින රලු ගල් විශේෂයක් බවයි. තව තවත් හිරිගල් සුඹුලු තවරගනිමින් එනම් දුකම අනුභව කරමින් වඩා මෘදු සෞන්දර්යයක් බාහිරට ප්‍රදානය කරන ගමන් ඉන් මිදී සැඟවී ඉන්න යත්න දරන බවකි. ඇත්තටම මෙය ලලනා සිතක හැසිරීම කදිමට කියා නොපාන්නේද? දුකින් පීඩාවට පත් වූ යුවතියක් තව තවත් ඒ සංතාප හා ඉකියන් හදේ සිරකරගෙන තමා විසින්ම ඒ දුක තනිව උහුලමින් විඳවමින් පැහැදුල් පරිසරයකට නිරාවරණය නොවී සිටිනා කාන්තාමය ලක්ෂණය නොවේද මේ? මින් සෑම ස්ත්‍රියක්ම මෙවැනි යැයි අදහස් නොකෙරේ. තමන්ට පැමිණි දුකත් පැනි රසයි සිතා ඉවසා වදාරා සිටින යුවතියෝ බොහෝ අප සමාජයේ වෙසෙති. ඉතින් ඈ කියා පාන්නේ එවන් සිතැත්තියකගේ තතු නොවේද?

ගලින් නිමවුණද, ගල්මලක් තුළ කැටිවුණ අපූර්ව සෞන්දර්යය හා එයට නිසර්ගයෙන්ම උරුම වූ පරිසරය ඇසුරෙන් අප ජීවත් වන සමාජය වෙත හෙලූ ආලෝක කිරණයක් බඳුය මේ කව. කාන්තා සිතක, ජීවිතයක තතු වක්‍රෝක්තියෙන් ගෙන හැර පෑමට ධනුෂ්කාගේ මනා රූපකාර්ථවත් කවි බස මෙහිදී මහෝපකාරී වී තිබේ. දිය තලා මත්තේ නිතැතින් දකින්නට ලැබෙන තාවකාලික සුන්දරත්වයක් බඳු ඕලු නෙලුම් මානෙලාදියෙන් මිදී අඳුරු කරදිය ගැඹර පත්ලේ හෙමි හෙමින් වැඩෙන සදාතනික සෞන්දර්යය මේ ගල්මලයි. අපේ අඳුරු ජීවිත ඇතුළාන්තයටත් මදක් එබී කිමිදී එවන් වූ සදාතනික සෞන්දර්යයක් සොයා පාදා ගන්නට ශ්‍රද්ධානනය සපයන මේ කුඩා කව හිරිගල් සුඹුලු බඳු ඉකියකින් අපේ හදවත මොහොතකට සිර නොකරන්නේද?

